# දෙමළ ත්‍රස්තවාදය පරාජයකිරීම

මේ ලිපිය පළවන විට රණවිරුවන්ගේ වීරත්වය හමුවේ දෙමළ ත්‍රස්තවාදය පරාජය වීම ඉතිහාසයට අයත් එකක් විය හැකි ය. ඒ එසේ නොවුවත් දෙමළ ත්‍රස්තවාදයට තව දින කිහිපයකට වඩා ආයුෂ නැත. එහෙත් පරාද වී ඇත්තේ දෙමළ ත්‍රස්තවාදය පමණක් බව අමතක නොකළ යුතු ය. දෙමළ බෙදම්වාදය හා දෙමළ ජාතිවාදය තවමත් පරාජය වී නැත. ඒ පරාජය කිරීමට තවත් ටික කලක් ගතවන බව අමුතුවෙන් කිවයුතු නො වේ.

අද තමන් දෙමළ ත්‍රස්තවාදය පරාජය කළ හැකි බවට සැමදාමත් කියා ඇතැයි උදම් අනන, අඩුම තරමින් ඒ බව අඟවන පඬියෝ වෙති. එහෙත් මේ අය එදා ත්‍රස්තවාදයක් ගැන නො කීහ. ඔවුන්ට අනුව ඒ විමුක්තිවාදයක් විය. අඩුම තරමින් ඔවුන්ට ත්‍රස්තවාදියෝ සිංහලයන්ගෙන් වන අසාධාරණයට එරෙහිව සටන්කළ අය වූහ. ඔවුන් එකල මහත් උජාරුවෙන් තම පඬිබව විදහා දක්වමින් කියා සිටියේ දෙමළ ජනයා කොටින්ගෙන් ගලවාගැනීමට, කොටින්ගෙන් දිනාගැනීමට නම් බලය බෙදිය යුතු බව ය. කොටි පරාජය කිරීමක් ගැන ඔවුහු නො සිතූහ. මොවුන් අද කොටි පරාජය කිරීම ගැන තම සතුට ලෝකයාට ප්‍රකාශ කරන අතර තවමත් කියන්නේ බලය බෙදිය යුතු බව ය. අප මොවුන්ගෙන් ප්‍රවේසම් විය යුතු ය.

එකල මේ පඬියන්ගේ මුවග ලෙල දුන් මාඕ සේතුන්ගේ ගරිල්ලා භටයා ජනතාව නමැති ජලයේ පිහිනන මාළුවකු වැනි යැයි යන්න අද බොහෝ දෙනකුට අමතක වී ඇත. පඬියන් තර්ක කෙළේ ජලය ඉවත්කළ විට මාළුවා මැරී යන ආකාරයට ජනතාව ඉවත්කළ විට ගරිල්ලා භටයාට පැවැත්මට ඉඩක් නැතිවේය කියමිනි. ජනතාව ඉවත්කිරීමට නම් බලය බෙදිය යුතු ය යන්න ඔවුන්ගේ ස්ථාවරය විය. ත්‍රස්තවාදීයාට ත්‍රස්තවාදියා නොකියා ගරිල්ලා භටයා ආදී යෙදුම් භාවිතා කරමින් පඬියෝ තම බහුශ්‍රැතභාවය විදහා දැක්වූහ. පඬියන් අපට පෙන්වීමට තැත් කෙළේ මේ ගරිල්ලා මාළුවා පිහිනන ජලය අන් කිසිවක් නොව උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ ජනයා බව ය. මෙය පට්ටපල් බොරුවක් බව අපි ඒ දිනවල ම කීවෙමු. අවාසනාවකට වෙනත් අය ලියූ දෙයක් පමණක් නොව මා ලියූ දෙයක් වුව ද උපුටා දැක්වීමට මට නොහැක්කේ මා ක්‍රමානුකූලව දත්ත එකතුකරන ඊනියා පර්යේෂකයකු නොවීම නිසා ය. මා උපාධියට හැරෙන්නට පර්යේෂණ කර නැත. කෙසේ වුවත් දළ වශයෙන් ගතහොත් අප ගෙනා තර්කය පහත සඳහන් අයුරින් ගොනු කරගත හැකි ය.

ප්‍රභාකරන් ඊනියා මාළුවෙක් නො වේ. ඔහු පවතින්නේ ජනතාව නිසා නොව විජාතික බලවේග නිසා ය. මාඕගේ මාළු උපමාව මෙහි දී නො ගැලපෙයි. අප කළ යුත්තේ විජාතික බලවේගවලට සාර්ථක ව මුහුණ දීම ය. එදා නිවැරදි වූයේ පඬියන් ද, මාඕගේ උපමාව ද, අප ද යන්න දැන්වත් ජනතාව තේරුම් නොගන්නේ සිංහලයන් ප්‍රවාදාත්මක වියුක්ත චින්තනයෙහි එතරම් දක්ෂයන් නොවන බැවිනි. සිංහලයන් අතර ගෞරවයට, පිළිගැනීමට ලක්වනුයේ අනාගතය දකින්නන් නොව වර්තමානය විස්තර කරන විස්තර ප්‍රචාරකයන් ය.

ඉතා බලසම්පන්න අනභිබවනීය යැයි සැලකුණු කොටි සංවිධානය මෙතරම් සුළු කාලයක දී පරාජය වූයේ කෙසේ ද යන්න ඇතැමුනට ප්‍රශ්නයකි. එහෙත් අපට නම් එය ප්‍රශ්නයක් නො වේ. අප කියා සිටියේ අප කළ යුත්තේ කෙසේ හෝ කල්මැරීම බව ය. අවුරුදු කිහිපයක් අල්ලාගෙන සිටිය හැකි නම් කෘත්‍රිමය පරදවා අප ජයග්‍රහණය කරන බවට අපට විශ්වාසයක් විය. ඒ හුදු හිතිවිල්ලක් නොවී ය. අප ඒ නිගමනයට පැමිණියේ ප්‍රභාකරන් හා කොටි සංවිධානය කෘත්‍රිම වූ බැවිනි. කොටි සංවිධානය පමණක් නොව දෙමළ බෙදුම්වාදය හා දෙමළ ජාතිවාදය ද කෘත්‍රිම වෙයි. ඒ සියල්ල පළමුව ලන්දේසීන්ගේ හා පසුව බ්‍රිතානීන්ගේ නිර්මාණ වෙයි.

අද කොටින්ගෙන් බේරී ඊනියා සිංහල හමුදාව වෙතට පැමිණෙන දෙමළ ජනයා නිසා කොටි සංවිධානය නොපැවතුණු බව ඕනෑම පඬියකුට (අර ජාත්‍යන්තර සම්මානලාභී සිනමා නිෂ්පාදකයන්ගේ මුව සිගිත්තෙන් මේ සම්බන්ධයෙන් වදනක් පිටවනු තුරු අපි මුව අයාගෙන බලා සිටිමු. හමුදාව වෙතට ගැලූ මිනිස් ගංගාව අළලා චිත්‍රපටියක් නිපදවා ජාත්‍යන්තර සම්මානයක් දිනාගැනීමේ හැකියාවක් වේ ද?) ඒ ජනතාවගෙන් අසා දැනගත හැකි ය. ප්‍රභාකරන් මේ ජනතාව නමැති ජලයේ පිහිනුවා නොව බටහිරයන්ගේ ආයුධ මතවාද ධනය හා වෙනත් ශක්තීන් උපයෝගී කරගෙන ඒ

© Prof. Nalin De Silva

ජනතාව ලේ විලක් කරගනිමින් පිහිනුවේ ය. කොටි සංවිධානය ගරිල්ලා සංවිධානයක් ද නො වීය. ඔවුන්ට තිබූ ආයුධ ගරිල්ලා භටයන්ට ඔරොත්තු නොදෙන තත්වයේ විය.

කොටි පැරදුණේ දැන් ගරිල්ලා සටන් අභාවයට ගොස් ඇති නිසා ද නොවේ. ගරිල්ලා සටන් අභාවයට ගියත් නැතත් ගරිල්ලන් නොවූ කොටින්ට ඒ වලංගු නො වේ. කොටි සංවිධානය යනු බ්‍රිතානිය ප්‍රමුඛ බටහිරයන් විසින් ඇතිකරන ලද උගත් (බ්‍රිතානි අධ්‍යාපනය ඉංගිරිසියෙන් හෝ දෙමළෙන් හෝ ලබාගත් යන අරුතින්) දෙමළ ජනයාගේ ආයුධ සන්නද්ධ ඒකකය විය. ලන්දේසීන් විසින් දුම්කොළ වගාව සඳහා ලංකාවට ගෙනෙනු ලැබූ ජනයාගෙන් මූලිකව පැවතෙන දෙමළ ජනයාගේ ප්‍රභූවරු පළමුව ලන්දේසීන් විසින් ද පසුව බ්‍රිතානීන් විසින් ද සිංහලත්වය නැතිකිරීමට හෝ ඒ නොහැකි නම් දුර්වල කිරීමට හෝ යොදාගනු ලැබූහ. ප්‍රභාකරන් ද ඔහුගේ මස්සිනාලා ද, බාප්පලා ද සීයලා ද බ්‍රිතානීන් විසින් නිර්මාණය කරනු ලැබුවෝ ය. ඒ මුළුමනින් ම ව්‍යාජ දේශපාලන බලවේගයක් විය. එයට පැවැත්මක් තිබුණේ අප බටහිරයන් හමුවේ වැඳ වැටුණු තෙක් පමණ ය.

දෙමළ කොටි ත්‍රස්තවාදයට පමණක් නොව දෙමළ බෙදුම්වාදයට හා දෙමළ ජාතිවාදයට ද පැවැත්මක් ඇත්තේ අප බටහිරයන්ට වැඳ වැටෙන තෙක් පමණ ය. මෙහි දී බටහිරයන් යන්නෙන් බටහිර මතවාද හා පොදුවේ බටහිර දැනුම ද කියැවෙයි.  දෙමළ ජාතිවාදය බ්‍රිතානීන් විසින් ඇතිකරනු ලැබුයේ පොන්නම්බලම් කුමාරස්වාමි පවුල මුල්කරගෙන ඉංගිරිසි උගත් වෙල්ලාලයන් අතර ය. බ්‍රිතානීන් සිංහලයන්ට එරෙහිව දෙමළ ජාතිවාදීන්ට දුන් වරප්‍රසාද එකිනෙක නැතිවන විට දෙමළ ජාතිවාදීහු ඊනියා අසාධාරණ ගැන කියමින් පනස්හයෙන් පසු ක්‍රමයෙන් රටින් පිටවීමට පටන්ගත්හ. මුලින් ම බර්ගර්වරු පනස්හයේ සංස්කෘතික පෙරළිය ඉවසාගත නොහැකි ව ප්‍රධාන වශයෙන් ඕස්ට්‍රේලියාවට හා වෙනත් රටවලට සංක්‍රමණය වූවෝ ය. දෙමළ ජාතිවාදීන් පසුව ඊනියා අසාධාරණකම් ගැන කියමින් බර්ගර්වරුන් අනුගමනය කරමින් ලංකාවෙන් පිටවූහ. අද ලෝකය පුරා විසිරී සිටින මේ දෙමළ ජනයා විසුරුණු දෙමළ ජනයා හෝ බර්ගර් දෙමළ ජනයා ලෙස හඳුන්වමු. මෙහි බර්ගර් යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඉහත සඳහන් විස්තරයෙන් පඬියන්ට හැර අන් අයට අවබෝධ වන්නේ යැයි සිතමි.

දෙමළ ජනයාට සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වීම නිසා සිදු වූ අසාධාරණය කුමක් ද? සිංහල භාෂාවට කලින් රාජ්‍ය භාෂාව වූයේ ඉංගිරිසි මිස දෙමළ නො වේ. දෙමළ රාජ්‍ය භාෂා තත්වයෙන් ඉවත්කර සිංහලය රාජ්‍ය භාෂාව කෙරී නම් එමගින් දෙමළුට අසාධාරණයක් විය හැකිව තිබුණි. එහෙත් එවැනි තත්වයක් නොමැතිව සිංහලය රාජ්‍ය භාෂාව කිරීමෙන් දෙමළ ජනයාට අසාධාරණයක් ඉටු නොවේ. බර්ගර්වරුන්ගේ මව් භාෂාව ඉංගිරිසි වූ බැවින් සිංහලය රාජ්‍ය භාෂාව කිරීමෙන් ඔවුන්ට අසාධාරණයක් වී යැයි තර්ක කළහැකි වුව ද (ඒ ඔවුන්ගේ වරප්‍රසාදයක් නැතිවීම පමණකි.) රාජ්‍ය භාෂාව නොවූ දෙමළ තවදුරටත්  රාජ්‍ය භාෂාව නොවීම නිසා සාමාන්‍ය දෙමළ ජනයාට කිසිවක් නැති නොවී ය. එහෙත් ඉංගිරිසි උගත් දෙමළ ජනයාට නම් තම වරප්‍රසාද නැතිවිය. පළමුවෙන් රට හැරගියෝ බර්ගර්වරු වූහ. පසුව ඉංගිරිසි උගත් දෙමළ ජනයා ඊනියා අසාධාරණ ගැන කියමින් රට හැර ගියහ.

දෙමළ බෙදුම්වාදය හා දෙමළ ජාතිවාදය පවතින්නේ අර කොටින්ගෙන් බේරී හමුදාව වෙතට පැන ආ දෙමළ හා ඇතැම් විට සිංහල දන්නා දෙමළ ජනයා අතර නොව කොළඹ සිටින ඇතැම් ඊනියා උගත් දෙමළ ජනයා හා විසුරුණු හෙවත් බර්ගර් දෙමළ ජනයා අතර ය. ඇතැම් සිංහල ප්‍රජකයන් හා පඬියන්, කසිකබල් මාක්ස්වාදීන්  අතර ද දෙමළ ජාතිවාදය ඇත. කොටි ත්‍රස්තවාදය පරාජය වුවත් දෙමළ බෙදුම්වාදය හා දෙමළ ජාතිවාදය එකී අය අතර වෙයි. කොටි ත්‍රස්තවාදයේ පරාජයෙන් පසුව මින් මතු බ්‍රිතානීන් ප්‍රමුඛ බටහිරයන් සිංහලත්වයට විරුද්ධව මූලික වශයෙන් යොදාගන්නේ විසුරුණු හෙවත් බර්ගර් දෙමළ ජනයා ය. බටහිරයන් මේ විසුරුණු දෙමළ ජනයා ප්‍රභාකරන් (ඔහු ජීවත්ව සිටී යන උපකල්පනය යටතේ) යටතේ නාමිකව වුව ද සංවිධානය කරනු ඇත. දෙමළ ජාතිවාදීන් මින්පසු හැකිතාක් ජාත්‍යන්තර වශයෙන් තම ඊනියා ප්‍රශ්නය විසඳාගැනීමට උත්සාහ දරණු ඇත. අප එහි දී කිසි විටෙකත් බටහිරයන්ට වැඳ නොවැටිය යුතු ය. බටහිරයන් වෙනුවෙන් කඩේ යන විසුරුණු දෙමළ ජනයා සහ මෙරට හා පිටරට අනෙක් විජාතික බලවේග පරාජය කිරීමට අප සූදානම් විය යුතු ය. මෙහි දී අපේ අවධානය ප්‍රථමයෙන් ම යොමුවිය යුත්තේ එදා කොටි පැරදවීමට නොහැකි බව කී එහෙත් අද තමන් කොටි පරාජය කළාක් මෙන් උදම් අනමින් ඒ අතර බලය බෙදීමට කතාකරන පඬියන් කෙරෙහිය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva